# ත්‍රිපිටකය ගෝර්කි හා රත්න ශ්‍රී



විවරණ මිහිර

කරුණාරත්න අමරසිංහ

**මගේ රසිකයෙකු මෙන්ම මිතුරෙකුද වන පාලිත අරවින්ද වීරක්කොඩි සිවදුන් විසින් මා වෙත එවන ලද නුවණ සගරා කලබක් පසුගිය දිනක මගේ පොත් ගුල් රාක්කයකින් අහම්බෙන් හමුව වුණි. පොතේ සඳහන් පරිදි එය වූ කලී අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ සිංහල භාෂා ඒකකය විසින් ප්‍රකාශිත නුවණ සඟරාවේ 2018 වසරේ තෙවන වෙළුමේ තෙවන කලාපයි. එහි අන්තර්ගත ලිපි අතර ලංකා විශ්වවිද්‍යාලය සහ මානව ශාස්ත්‍ර අධ්‍යාපනය යන මාතෘකාව සහිත ලිපියක් විය. එය පළව තිබුණේ ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහයන්ගේ නමිනි.**

විජේසිංහයන් විසින් සැපයුණු ලිපියක් යැයි සිතු මුත් එය එසේ නොවුණි. "ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ පසුගිය ද රුහුණ විශ්වවිද්‍යාලයේ රවීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරයේ පැවැති උපාධි ප්‍රදානෝත්සවයේදී කළ දේශනයයි. යන පාඨය ලිපිය අග මුද්‍රිතව තිබුණු හෙයිනි. මම වහාත් උනන්දුවෙන් එය කියවීමි. නුවණ සගරාව නුවණ දෙන දේශනයක් සේ සලකා එය පළකර ඇතැයි සිතූ බැවිනි. එහෙත් නුවණ නමැති නුවන කාණ කරන කාරට මුලාශ්‍ර කීපයකින් දේශනය පුරුක්වට ඇති බව දැනගන්නා වූයේ සැණ ක්ෂණයෙකිනි. නුවණ සගරා පාඨකයන්ගේ මෙන්ම ශාස්ත්‍ර ගෞරවයෙන් යුත් කාගේත් නැණැස කණ නොවනු පිණිස ඒවා පෙළ් පොට දක්වා නිවැරදි කිරීම ශාස්ත්‍රීය වගකීමක් සේ සලකා තැවින් මෙසේ පැන පෑණ ගැන්වීමි.

යට සඳහන් පාචාර්ය උපාධි දේශනය ඇරඹෙන්නේ රත්න ශ්‍රී විජේසිංහයන් මුවින් බිඳු ත්‍රිපිටක ග්‍රන්ථ මූලාශ්‍ර නොකොට ගත් අර්ථ වාක්‍ය විවරණයකිනි. එය නුවණ සගරා ලිපියේ පළව ඇත්තේ මෙසේය.

"ගෞතම දේශයට රත්නයක් වූ මගේ රුහුණ විශ්වවිද්‍යාලයේ තේමා පාඨය" පඤ්ඤා නරානං රතනං යන්නයි. මනුෂ්‍යයාට ප්‍රඥාව රත්නයක් යන්නයි ඉන් කියැවෙන්නේ. සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයේ සගාථ වර්ගයෙහි ඒ ගාථා පාඨය ඇතුළත් වන්නේ. දෙවියන් විසින් නගන ප්‍රශ්න සතරකට පිළිතුරු සපයමින් බුදුන් වහන්සේයි ඒ පිළිතුරු දෙන්නේ.

**කිංසු නරානං රතනං**
**කිං සු චෝරා හඩු වරං**
යන ප්‍රශ්න දෙකට පිළිතුරු ලෙසයි
**පඤ්ඤා නරානං රතනං**
**පුඤ්ඤං චෝරානාඩු වරං**

යොදාවාන් දක්වා ඇත්තේ.

මෙය සම්පූර්ණ සාවද්‍ය මූලාශ්‍ර දැක්වීමකි. ගැරුද වැරදිය. නියම මූලාශ්‍රය එන්නේ සංයුක්ත නිකායේ, සගාථ වර්ගයේ පළමු දේවතා සංයුක්තයේ සයවන ජරා වර්ගයට අයත් පළමු ජරා සූත්‍රයෙහි හා දෙවන 'අජරසා' සූත්‍රයෙහි ය. එය මෙසේ උපුටා දක්වමි.

**<u>01 'ජරා' සූත්‍රය</u>**

**දෙවියෙක්:**

**I. කිං සු යාව ජරා සාධු - කිං සු සාධු පතිට්ඨිතං**
**කිං සු නරානං රතනං - කිංසු චෝරෙහි දූහරන්ති**

**<u>බුදුනු:</u>**

**II. සීලං යාව ජරා සාධු - සද්ධා සාධු පතිට්ඨිතා**
**පඤ්ඤා නරානං රතනං - පුඤ්ඤං චෝරෙහි දූහරන්ති**

I. මහලු වනතුරු අවසාන කොට කිමෙක් මැනවිද? කිමෙක් සිතේ පිහිටීමේ නම් මැනවිද? කිමෙක් මිනිසුන්ට මැණිකක් වේද? කිමෙක් සොරුන්ට ගෙනයා නොහැකිද?

II. මහලු වනතුරු අවසාන කොට සිල් රැකීම මැනවි. ශ්‍රද්ධාව සිතේ පිහිටීමේ නම් මැනවි. ප්‍රඥාවම මිනිසුන්ට මැණිකකි. පිනම සොරුන්ට ගෙන යා නොහැකිය.

**<u>2. අජරසා සූත්‍රය</u>**

**දෙවියෙක්:**

**I. කිංසු අජරසා සාධු - කිං සු සාධු අධිට්ඨිතං**
**කිං සු නරානං රතනං - කිංසු චෝරෙහි හාරියන්ති**

**<u>බුදුනු:</u>**

**II. සීලං අජරසා සාධු - සද්ධා සාධු අධිට්ඨිතා**
**පඤ්ඤා නරානං රතනං - පුඤ්ඤං චෝරෙහි හාරියන්ති**

I. නොදිරා යන කිමෙක් මනාප වේද? කිමෙක් පිහිටීමේ නම් මනාප වේද? කිමෙක් මිනිසුන්ට මැණිකක් වේද? කිමෙක් සොරුන්ට හැරගත නොහැකිද?

II. නොදිරා යන සීලයම මනාප වේ. ශ්‍රද්ධාව පිහිටීමේ නම් මනාප වේ. ප්‍රඥාවම මිනිසුන්ට මැණිකකි. පිනම සොරුන්ට හැරගත නොහැකිය.

රත්න ශ්‍රී විජේසිංහයන් තම ආචාර්ය උපාධි දේශනයේදී සාවද්‍ය කොට දක්වා ඇති අනික් මූලාශ්‍රය නුවණ සගරා ලිපියේ සඳහන් වන්නේ මෙසේය.

"උපයෝගිතා අර්ථයෙන් මේ සෞන්දර්ය සහ සංස්කෘතිය මානව ජීවිතවලට බද්ධ කර ගන්නා ආකාරය ගැන මැක්සිම් ගෝර්කි නම් ප්‍රකට සෝවියට් ලේඛකයා ඉතා වැදගත් ප්‍රකාශ 2 ක් කළා. 1930 දශකයේ මැද භාගයේ සෝවියට් දේශයේ පැවැත් වූ ලේඛක සමුළුවකදීයි එම ප්‍රකාශය කළේ.

"Hunger is base of Civilization"

'Love is base of Culture"

ක්ෂුධාව හෙවත් කුසගින්න ශිෂ්ටාචාරයේ පදනමයි. ආදරය සංස්කෘතියේ පදනමයි"

රත්න ශ්‍රී විජේසිංහයන්ගේ මේ මූලාශ්‍රයද සම්පූර්ණ සාවද්‍ය වූවකි. මෙහි නියම මූලාශ්‍රය ම විසින් නිතර උපුටා දක්වන්නක් හෙයින් එය පළිඟු මිණක් සේ මගේ මතකයේ දිදුලයි. මිනිසත් බවේ ගැඹුරු පැතිකඩ ගැන කියැවෙන හෙළිකළ ප්‍රකාශයක් වන් කියමනක් උපුටා දක්වන මැක්සිම් ගෝර්කි ඒ ගැන විග්‍රහයක්ද සපයයි. මෙය හමුවන්නේ ඔහු විසින් ලියන ලද Fat Men's Music නමැති ලිපියෙහිය. මවිසින් නිතර උපුටා දක්වන මූලාශ්‍රය සහිත එම ලිපිය මා කියවූයේ ගෝර්කිගේ Articles and Tamphlets නම් පොතෙනි. ගෝර්කි උපුටා දක්වා ඇත්තේ ජර්මන් ජාතික නාට්‍යකරුවෙකු, කවියෙකු, ඉතිහාසඥයෙකු, විචාරකයෙකු සහ වෛද්‍යවරයෙකු වන විශ්ව විශ්‍රුත Friedrich Vonschiller (1759 - 1805) ගේ අර්ථ වාක්‍යයෙකි. එය ගෝර්කි නම් Fat Men's Music නමැති ලිපියේ සඳහන් කරමින් ඊට විග්‍රහයක්ද සපයා ඇත්තේ මෙලෙසිනි.

Hunger and Love Make The World go Round

'Schiller said. Love is the basis of Culture, Hunger is the basis of Civilization'

ලෝකය චක්‍රගතවනු ලබන්නේ කුසගින්න හා ආදරය විසින් යැයි ෂිලර් (කවියා) පැවසීය. ආදරය වනාහි සංස්කෘතියේ පදනමයි. කුසගින්න වනාහි සභ්‍යත්වයේ පදනමයි.